# Death of a President

**115mins / 2006 / UK Faux Docu.**

අධ්‍යක්ෂණය- Gabriel Range

නාටකීය - ප්‍රබන්ධාත්මක



බ්‍රිතාන්‍ය අධ්‍යක්ෂවරයෙකු වූ Gabriel Range විසින් නිමවූ මෙම සිනමාපටය ඇමරිකාවේ 43 වැනි ජනාධිපතිවරයා වූ ජෝර්ජ් ඩබ්. බුෂ්ගේ ඝාතනය පිළිබඳව කියැවෙන ප්‍රබන්ධාත්මක චිත්‍රපටයකි. මෙහි කතාව ගොඩනගා ගැනීමට ඔහු අඩුවැඩිය සොයාගෙන ඇත්තේ රාජ්‍ය ලේඛණාගාරයෙන්, නළු නිළියන් මගින් මෙන්ම පරිගණක තාක්ෂණයේ රංග ප්‍රයෝගයන් ආධාර කොටගෙනය. බුෂ්ගේ විදේශ ප්‍රතිපත්තිය, ජාතිවාදී ස්වරූපයන්, මහජන නිදහස කප්පාදු කර දැමීම, සිවිල් අණ නොපිලිපැදීම මෙන්ම මාධ්‍ය මගින් ගෙන යන හැඟීම් ඇවිස්සීමේ ක්‍රියාවලිය මෙහි කතා ආවරණය සඳහා යොදාගෙන තිබේ.

2007 ඔක්තෝබර් මස 19 වැනි දින බුෂ් ජනාධිපතිවරයාගේ ඝාතනය සිදුවූ අයුරු ප්‍රබන්ධිත ප්‍රවෘත්ති ප්‍රචාරයන් මගින් අනාවරණය කෙරේ. එම පුවත් මගින් කියවෙන්නේ එදින චිකාගෝ නුවර හෝටලයක දී ආර්ථිකය පිළිබඳව දේශනයක් නිමා කර නගරවැසියන් හා සාමිචියේ යෙදෙමින් සිටින ජනාධිපතිවරයාට දුර සැඟවී වෙඩි තබන්නෙකු විසින් වෙඩි තබා ඇති බවත් ඒ වනවිට හෝටලය ඉදිරිපිට දැවැන්ත යුද විරෝධී හා බුෂ් විරෝධී රැළියක් පැවැත්වෙමින් තිබූ බවත්ය. ඝාතනය සඳහා සැකපිට අත්අඩංගුවට ගනු



ලැබුවේ අමාල් අබු ෂික්රි නම් සිරියානු සම්භවයකින් යුතු පුද්ගලයෙකි.

නියෝජ්‍ය ජනාධිපති ඩික් චෙනී, සැකකරුගේ අල්කයිඩා සම්බන්ධතාවයන් සිය න්‍යාය පත්‍රය සඳහා උනන්දුවෙන් උපයෝගී කර ගැනීමට සැලසුම් කරයි. "Patriot Act 3" මගින් ඔහු නව විධිවිධානයන් පනවා FBI පොලීසියට හා අනිකුත් රාජ්‍ය ආරක්ෂක කණ්ඩායම් වෙත බලතල ලබා දෙන්නේ ඇමරිකානු හා අනිකුත් ජනයා දැඩි ලෙස සෝදිසියට භාජනය කිරීම සඳහාය. එමෙන්ම සිරියාවට පහර දීම ද ඔහුගේ අරමුණය.

සැක සහිත සාක්ෂි මත වුව ද 'ෂික්රි' උසාවිය මගින් වැරදිකරු බවට තීරණය කරයි. නමුත් ඇත්තෙන්ම ඝාතකයා ඇමරිකානු ජාතිකයෙකි. යුද සෙබළෙකු වූ ඔහුගේ පුතු ඉරාක යුද්ධයට පිටත් කර තිබේ. එහිදී ඔහු මිය යයි. සිය පුතුගේ මරණයෙන් අතිශය කම්පනයට පත් සෙබළාගේ පියා බුෂ්ට වෙඩි තබා සිය දිවි තොර කර ගනී. ඒ බව මියැදීමට පෙර ඔහු මෙසේ ලියා තබා තිබේ. **සදාචාරාත්මක නොවන කාරණා උදෙසා අපේ ඩේවිඩ් මරා දැමූ බුෂ්ට මගෙන් කිසිදු සමාවක් නැත.** බුෂ් ඝාතනය කොට මාස 10 ක් ඉකුත් වී ගිය ද ෂික්රි සිරගතවී සිටී. රජය ඔහුගේ අභියාචනය කල් දමමින් සිටී.

මෙම චිත්‍රපටය සඳහා 2006 සැප්. 10 ටොරන්ටෝ ජාත්‍යන්තර සිනමා උළෙලේ විචාරක සම්මානය හිමි විය. නමුත් ඇමරිකාවේ දැවැන්තම සිනමා ජාලයක් වූ රීගල් හා සිනෙමාක් මගින් චිත්‍රපටය ප්‍රදර්ශනය ප්‍රතික්ෂේප කොට ඇත. CNN හා National Public Radio හි මෙම චිත්‍රපටය පිළිබඳ වෙළඳ දැන්වීමක්වත් ප්‍රචාරය නොකිරීමට වග බලා ගෙන තිබේ. එහි විෂය වස්තුව සොබාවිකත්වය ඉක්මවා යන බව ඔවුන් කියා තිබේ. බුෂ් පාලනය මේ ගැන කිසිදු විචාරයක් කර නැත. නමුත් බොහෝ දෙනා බුෂ්ගේ නව විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව, මෙම චිත්‍රපටය සීරුවෙන් කළ අධ්‍යයනයක් බව පිළිගනියි.

